SRI LANKA
TOURISM DEVELOPMENT
AUTHORITY

/sltda.gov.lk/ www.sltda.gov.lk




**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) වනාහි, සංචාරක කර්මාන්තයේ හා ඒ හා සබැඳි කර්මාන්තායතනවල කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යන කර්තව්‍යයන් පැවරුන රජයේ අධිකාරියයි, සංචාරක අංශය, අනාගතය සඳහා ජාතික ආර්ථිකය වෙතට තීරණාත්මක දායකත්වයක් සපයන්නාවූ ක්ෂේත්‍රය ලෙස හඳුනාගෙන ඇත්තේය. තවද මෙම අංශය විසින් රටේ ඉහළ පැතිකඩක් සහිත ආයෝජන ව්‍යාපෘති කෙරෙහි සහ ඉහළම සෘජු විදේශීය ආයෝජන සමහරක් ආකර්ෂණය කරනු ලබන අංශයක් ලෙස පෙරමුණේ සිටී.**

## කනිෂ්ඨ කළමනාකරු / තොරතුරු තාක්ෂණ (මෘදුකාංග)

**ආයතනයේ මෘදුකාංග යෙදවුම් ක්‍රියාත්මක කිරීම හා සහය දැක්වීම පිළිබඳ වගකීම් භාරය දැරිය යුතුය.**

**රැකියා කාර්යයන් :**

- ආයතනය ඇතුළත විවිධ මෘදුකාංග යෙදවුම් ක්‍රියාත්මක කිරීම
- යෙදවුම්වලට සහය දැක්වීම සහ මෘදුකාංග අලෙවිකරුවන් සමග සම්බන්ධීකරන කටයුතු සිදු කිරීම
- අවශ්‍ය විට පරිශීලකයන් පුහුණු කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී අන්ත පරිශීලකයන් හට සහය වීම
- RFP, SRS, CR පිළියෙළ කිරීම

**අවශ්‍ය තැනැත්තා :**

***අපේක්ෂකයා සතුව***

- තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් **හෝ**
- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 07 මට්ටමට සමාන හෝ ඉහළ ප්‍රවීනතා සහතිකයක්

**හෝ**

- ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමට සමාන ඉහළ ප්‍රවීනතා සහතිකයක් සහ අදාළ ක්ෂේත්‍රයේ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 (පහක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද **හෝ**
- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 මට්ටමට සමාන හෝ ඉහළ ප්‍රවීනතා සහතිකයක් සහ අදාළ ක්ෂේත්‍රයේ, රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 10 ක (දහයක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්දක්ද

තිබිය යුතුය.

**අමතර සුදුසුකම් :**

- මෘදුකාංග යෙදවුම් ක්‍රියාත්මක කිරීම් සහ සහාය දැක්වීම් පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
- අන්තයෙන් - අන්තයට මෘදුකාංග යෙදවුම් ක්‍රියාත්මක කිරීම හෝ සහය දැක්වීම පිළිබඳ පළපුරුද්දක් සහිත වන්නේ නම් ප්‍රමුඛතාවයක් හිමිවේ.
- මෘදුකාංග සංවර්ධනය කිරීම (java, spring boot, kubernetes,vue js) පිළිබඳ පළපුරුද්දක් සහිත වීම වාසිදායක වනු ඇත.
- කණ්ඩායම් හැඟීමෙන් යුක්තව ක්‍රියා කරන, අනර්ඝ (වාචික හා ලිඛිත) සන්නිවේදන කුසලතා සහිත හා මනා විශ්ලේෂණාත්මක කුසලතා හා ගැටළු විසඳීමේ කුසලතා හිමි රාමුවෙන් පිට චින්තාවන් සහිත අයෙකු විය යුතුය.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට සහ රජයේ සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / රාජ්‍ය සංස්ථාවල හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තිකයින් හට බලනොපානු ඇත)

**වැටුප් පරිමාණය :** රු. 43,355/- - 10 x 755 - 18 x 1,135 රු. 71,335/- (JM 1-1)

**මූලික පියවර :** රු. 43,355/– + ජීවන වියදම් දීමනාව (COL)

**ප්‍රතිලාභ :**

- **සේවකයා සහ පවුල ආවරණය කරමින් විස්තීර්ණ හා ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හිමිවේ.**
- **ණය පහසුකම්**
- **වෘත්තීයමය අභිවර්ධනය සඳහා පුහුණුව ලබාදීම (දේශීය හා විදේශීය)**
- **ප්‍රවාහන දීමනාව**
- **දුරකථන දීමනාව**

**ඔබ රැකියා අවස්ථාව සඳහා උචිත හා නිසි අය ලෙස ඔබ අදහස් කරන්නේ නම්, කරුණාකර ඔබගේ ජීවදත්ත තොරතුරු (CV) අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්, වැඩ පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සමග ලේඛන ගත තැපෑලෙන් පහත ලිපිනයට 2022 මාර්තු මස 10 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ යොමු කරන්න.**

**කරුණාකර, අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කරන්න.**

**රජයේ දෙපාර්තමේන්තුවල / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානින් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.**

**සභාපති,
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.
80, ගාලු පාර,
කොළඹ 03.**